ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2015/12/21 |

## 2015 නොවැම්බර් මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2015 නොවැම්බර් මස 23 වැනි දින නව පාරිභෝගික මිල දර්ශකයක් ප්‍රකාශයට පත් කරන ලදී. 1953 වසරේ සිට, කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය ශ්‍රී ලංකාවේ නිල මිල දර්ශකය වශයෙන් පැවති අතර, 2002 හා 2006/07 වසර වල දී එහි පදනම් වර්ෂය යාවත්කාලීන කරන ලදී. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය(කො.පා.මි.ද.) (2006/07=100) මගින් ආවරණය වූයේ කොළඹ නාගරික ප්‍රදේශවල මිල විචලන පමණි. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (2006/07=100) වෙනුවට උද්ධමනය මැනීම සඳහා මින් ඉදිරියට භාවිතා වන ජාතික පාරිභෝගික මිල දර්ශකය, රටේ සියලුම පළාත් ආවරණය වන පරිදි ගණනය කරනු ලැබේ. වඩා පුළුල් ආවරණයක් සහිතව, පරිභෝජන හා වියදම් රටාවේ සිදු වූ මෑතකාලීන වෙනස්කම් වඩාත් හොඳින් පිළිබිඹු වන පරිදි පාරිභෝගික මිල දර්ශකවල පදනම සංශෝධනය කිරීමේ ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදවලට අනුගතව, ජාතික පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සිදු කර ඇත. ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි අයිතම ලැයිස්තුව හා පරිභෝජනය කරන ලද ප්‍රමාණ, 2012 ජූලි මස සිට 2013 ජූනි මස දක්වා ශ්‍රී ලංකාවේ සියලුම පළාත් ආවරණය වන පරිදි සිදු කරන ලද ගෘහ ඒකක

ආදායම් වියදම් සමීක්ෂණයෙන් රැස්කරගත් පරිභෝජන දත්ත මත පදනම් වන අතර, එහි අයිතම 407 ක් ඇතුළත් වේ.

ඒ අනුව, ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත, 2015 ඔක්තෝබර් මස පැවති සියයට 3.0 සිට 2015 නොවැම්බර් මස වන විට සියයට 4.8 දක්වා ඉහළ ගියේය.

2015 සැප්තැම්බර් මස සිට ඔක්තෝබර් මස දක්වා ජාතික පාරිභෝගික මිල දර්ශකය සියයට 2.6 කින් ඉහළ ගියේය. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් කාණ්ඩයේ අයිතමයන්හි මිල ඉහළ නැගීම, දර්ශකයේ මෙම මාසික ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රෙදිපිළි හා පාවහන්; ගෘහ උපකරණ හා නිවාස නඩත්තුව; ප්‍රවාහන; සෞඛ්‍ය; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩවල මිල ගණන් ද මාසය තුළ දී ඉහළ ගියේය. මත්පැන්, දුම්කොළ හා මත්ද්‍රව්‍ය; හා නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප කාණ්ඩවල මිල ගණන් පහළ ගියේය. මේ අතර, සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන; සහ ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩවල මිල ගණන් සාමාන්‍ය වශයෙන් නොවෙනස්ව පැවතුණි.

## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම (2013 = 100)

| වසර | මාසය | දර්ශක අගය | මාසික ප්‍රතිශතාත්මක වෙනස | ලක්ෂ්‍යමය ප්‍රතිශතාත්මක වෙනස |
|---|---|---|---|---|
| 2014 | ජනවාරි | 103.1 | | |
| | පෙබරවාරි | 103.0 | -0.1 | |
| | මාර්තු | 103.2 | 0.2 | |
| | අප්‍රේල් | 104.1 | 0.9 | |
| | මැයි | 104.9 | 0.8 | |
| | ජූනි | 106.2 | 1.2 | |
| | ජූලි | 107.0 | 0.8 | |
| | අගෝස්තු | 106.4 | -0.6 | |
| | සැප්තැම්බර් | 106.4 | 0.0 | |
| | ඔක්තෝබර් | 106.0 | -0.4 | |
| | නොවැම්බර් | 106.9 | 0.8 | |
| | දෙසැම්බර් | 108.6 | 1.6 | |
| 2015 | ජනවාරි | 112.8 | 3.9 | 9.4 |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 |
| | මැයි | 108.0 | 0.9 | 3.0 |
| | ජූනි | 109.1 | 1.0 | 2.7 |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව